සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023. 04. 19 |

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත,

**සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් හඳුනා ගැනීම - 2022 වැඩසටහනට අදාළ ඉදිරි පියවරයන් ක්‍රියාත්මක කිරීමට අදාළ ඉලක්කගත කාල රාමුව**

සුබසාධක ප්‍රතිලාභ ගෙවීම ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් හඳුනා ගැනීම - 2022 වැඩසටහනට අදාළ ගෙවීම් කටයුතු 2023.07.01 දින සිට ක්‍රියාත්මක කළ යුතු බව 2023.04.17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බලා තීරණය කරන තිබේ.

02. එහෙයින් සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාළව සම්පූර්ණ කළ යුතු වැඩ පියවරයන් ආපස්සට සැලසුම් කළ යුතුව ඇති අතර එම සියළු වැඩ පියවරයන් 2023.06.30 වන දිනට ක්‍රියාත්මක කර අවසන් කර තිබීම ද අනිවාර්යය වේ. තවද කිසිදු හේතුවක් හෝ තත්ත්වයක් මත මෙහි කාලසීමාව තවදුරටත් දීර්ඝ කිරීමේ හැකියාවක් නොමැති බව ද ඉතා කාරුණිකව ඔබ වෙත දැන්වීමට කැමැත්තෙමි.

03. එබැවින් උක්ත වැඩසටහන වඩාත් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා එයට අදාළව අනුගමනය කළ යුතු වැඩ පියවරයන් සම්බන්ධයෙන් ඉලකක්කගත කාල රාමුවක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සකස් කර ඇති අතර එය ඔබගේ කාරුණික අවධානය පිණිස ඊළඟ පිටුවේ දක්වා ඇත.

ාර්යාලය / ...லுவலகம் / ...te — Tel: 009411- 2151481, 009411- 2484600/4117, Fax: 009411- 2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail — welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website — www.wbb.gov.lk

**සුබසාධක ප්‍රතිලාභ ගෙවීම ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් හඳුනා ගැනීම - 2022 වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ ඉලක්කගත කාල රාමුව**

| අනු අංකය | අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය | ඉලක්කගත කාල සීමාව |
|---|---|---|
| 01 | තේරීම් කමිටුවේ පළමු හා දෙවන සාමාජිකයා විසින් තේරීම් කමිටුවේ තෙවන සාමාජිකයා එනම් සංගණන නිලධාරියා විසින් රැස් කරනු ලැබූ දත්තවල නිරවද්‍යතාවය පරීක්ෂා කර බලා එහි සත්‍යතාවය පිළිබඳව තහවුරු කිරීමෙන් පසු එම දත්ත ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිය සහිතව පද්ධතිගත කිරීම. | 2023.04.30 |
| 02 | සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහාම අභියාචනා කමිටුවක් පත් කිරීම. | 2023.05.05 |
| 03 | ක්ෂේත්‍ර සමීක්ෂණයේදී සත්‍යාපනය කරගන්නා ලද දත්ත අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු බවට හඳුනාගත් තැනැත්තන්ගේ/ පවුල්වල නම් ලැයිස්තුව අදාළ පොදු නිර්ණායකයන් හා දර්ශකයන් අනුව දරිද්‍රතා ලකුණු ඇගයීම සඳහා ඉදිරිපත් කිරීම. | 2023.05.07 |
| 04 | සුබසාධක ප්‍රතිලාභ පනතේ සඳහන් කර ඇති පොදු නිර්ණායකයන් හා දර්ශකයන්ට අනුව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් කවුරුන්ද යන්න තීරණය කිරීම. | 2023.05.10 |
| 05 | සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් හඳුනාගෙන එම ප්‍රතිලාභීන්ගේ නම් ලැයිස්තුව පොදු මහජනතාව වෙත ප්‍රසිද්ධ කිරීම. | 2023.05.12 |
| 06 | අභියාචනා සලකා බැලීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම. | 2023.05.15 |
| 07 | සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධයෙන් වන හිමිකම්පෑම්/ විරෝධතා භාරගැනීම. | 2023.05.25 |
| 08 | අභියාචනා කමිටුව වෙත ඉදිරිපත් කර ඇති හිමිකම්පෑම්/ විරෝධතා සම්බන්ධයෙන් පරීක්ෂණ හෝ විමර්ශන කටයුතු පවත්වා අදාළ තොරතුරු සත්‍යාපනය කර ගැනීම. | 202306.02 |
| 09 | හිමිකම්පෑම්/ විරෝධතා සම්බන්ධයෙන් ගනු ලැබූ අවසන් තීරණ පිළිබඳව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කොමසාරිස්වරයා දැනුවත් කිරීම. | 2023.06.16 |
| 10 | අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස වඩාත් සුදුසු තැනැත්තන්/ පවුල් තෝරා ගැනීම. | 2023.06.25 |
| 11 | සුබසාධක ප්‍රතිලාභ දීමනා ලැබීමට සුදුසුකම් ලැබූ තැනැත්තන්/ පවුල් සඳහා ප්‍රතිලාභ දීමනා බැංකුගත කිරීම. | 2023.06.30 |

ඉහත අංක 03 හි සඳහන් "අභියාචනා කමිටු පත් කිරීම" පහත සඳහන් පරිදි විය යුතුය.

01)මණ්ඩලය විසින්, සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහාම අභියාචනා කමිටු යම් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතුය.

02) අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් මත එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා අවශ්‍ය අභියාචනා කමිටු සංඛ්‍යාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතුය.

03) එක් එක් අභියාචනා කමිටුව පහත දැක්වෙන පරිදි සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(අ) අභියාචනා කමිටුව පත් කරනු ලබන්නේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් හෝ කොට්ඨාස සම්බන්ධයෙන් ද එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හෝ කොට්ඨාස හැර වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වෙත අනුයුක්ත කර ඇති ප්‍රාදේශීය ලේකම්වරයෙකු:

(ආ) අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති රජයේ නිලධරයෙන් දෙදෙනෙකු; සහ

(ඇ) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සුබසාධක ප්‍රතිලාභ කටයුතුවල සක්‍රීයව නිරත වන රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරනු ලබන තැනැත්තන් දෙදෙනෙකු.

04. තවද මෙම වැඩසටහන වඩාත් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගෙන් දැනටමත් ලැබෙන්නාවූ සහාය ඉතා අගයකොට සලකනු ලබන අතර එය ඉදිරියටත් අපේක්ෂා කරමි.

බී. විජයරත්න
සභාපති / කොමසාරිස්

පිටපත :
සියළු දිසාපතිවරුන් වෙත - කාරු.දැ.ගැ.ස.